දිනමිණ The Dinamina e paper



# සුදුසුකම් තිබෙන නිර්මාණශීලී අය ඉදිරිපත් කිරීම පක්ෂවල වගකීමක්

## ● පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ නීතිඥ රෝහන හෙට්ටිආරච්චි

**අනුර ප්‍රේමලාල්**

නව මැතිවරණ ක්‍රමයෙන් නිසි ප්‍රයෝජන ගැනීමට නම් පළාත් පාලන මැතිවරණයේ දී නිවැරැදිව දක්ෂ සුදුසුකම් තිබෙන නිර්මාණශීලී හැකියාවන් ඇති පුද්ගලයන් සිය ලැයිස්තුවලට ගෙන ඒම දේශපාලන පක්ෂවල වගකීමක් වන අතර, ඒ සඳහා ජනතාවද පෙළ ගැසිය යුතු බව පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ නීතිඥ රෝහන හෙට්ටිආරච්චි මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා මේ බව සඳහන් කළේ ඊයේ (18) කොළඹ 07, හෙක්ටර් කොබ්බෑකඩුව කෘෂි පර්යේෂණ ආයතනයේ පැවැති මාර්තු 12 ව්‍යාපාරයේ මාධ්‍ය හමුවට එක්වෙමින්ය.

එහි දී වැඩිදුරටත් කතා කළ විධායක අධ්‍යක්ෂවරයා,

නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය ඉදිරිපත් කළේ ඉකුත් රජයයි. වත්මන් රජය එහි යම් යම් සාධනීය සංශෝධන ඇති කර තියෙනවා. හැබැයි අපි දන්නේ නෑ මැතිවරණ පවත්වන දිනය කවදාද කියලා. එය දෙවියන් වහන්සේටවත් කියන්න හැකිද කියලා ගැටලුවක් තියෙනවා. මේ නව මැතිවරණ ක්‍රමයෙන් කොට්ඨාසයට වගකියන මන්ත්‍රීවරයෙක් ලැබෙනවා. ඒක සාධනීය කරුණක්. මේ මැතිවරණය හරහා කාන්තා නියෝජනය වැඩි වෙලා තියෙනවා. ඡන්ද ගණන් කිරීම ඡන්ද පොළ තුළම සිදුවෙනවා. මේ මැතිවරණ ක්‍රමය හරහා අපට තිබූ මනාපය නැති වෙලා තියෙනවා. මේ ක්‍රමයේ දී මන්ත්‍රී ගණන දෙගුණයක් වෙනවා. එය සාධනීය වෙන්නත් පුළුවන් නොවෙන්නත් පුළුවන්. ජනතාවට නඩත්තු කරන්න වෙන මහජන නියෝජිතයන් පිරිස දෙගුණයක් වෙනවා. එවැනි තත්ත්වයක් තුළ දේශපාලන පක්ෂ නිවැරැදිව සිය අපේක්ෂකයන් තේරුවේ නැත්නම් එය අනාගතයට බලපානවා.

ඒ අනුව දේශපාලන පක්ෂ සිය අපේක්ෂක ලැයිස්තු නිවැරැදිව සුදුස්සන් තේරුවේ නැත්නම්, කාන්තා නියෝජනය වැඩි කළාට ඵලක් නැහැ. මැතිවරණයේ අරමුණ ඉටුවන්නේ නැහැ. නැවත වරක් එන්නේ පක්ෂවල දිස්ත්‍රික්කවල සිටින නායකයන්ගේ හිතෛෂීන් නම් ඔවුන්ගේ පවුලේ උදවිය නම් ජනතාවට සෙතක් වෙන්නේ නැහැ. ඒ නිසා අපි දේශපාලන පක්ෂවලට අවධාරණය කර සිටිනවා. ඡන්ද දායකයන්ගේ තේරීම නැති නිසා දේශපාලන පක්ෂ රටට තම පාක්ෂිකයන්ට කියන්න අවශ්‍යයි අපේක්ෂකයන් තෝරාගත් නිර්ණායක රටට පැවැසිය යුතුයි. මාර්තු 12 ව්‍යාපාරය ඒ සම්බන්ධයෙන් නිර්ණායක අටක් ඉදිරිපත් කර තියෙනවා. අපේ නිර්ණායක නම් තියෙන්නේ දූෂණ සම්බන්ධ කරුණුයි. ඒ නිසා දේශපාලන පක්ෂවලින් ඉල්ලනවා තම අපේක්ෂකයන් ඉදිරිපත් කරන නිර්ණායක පැවැසිය යුතුයි. දැනටමත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හා එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්වරු දෙදෙනා වරක් මේ ගැන පැවැසුවා අපි නිර්ණයන්ට අනුවයි අපේක්ෂකයෝ තෝරන්නේ කියලා. නමුත් මේවා කියලා විතරක් මදි එම නිර්ණායක රටට හෙළිදරව් කළ යුතුයි. මෙහි 40%ක් නියෝජිතයෝ පත් කරන්නේ පක්ෂ නායකයන්ගේ අභිමතාර්ථ අනුවයි. සීයට සීයක්ම කොට්ඨාසයට නියෝජිතයෝ පත්වෙන්නේ ප්‍රාදේශීය නායකයාට අවශ්‍ය ආකාරයටයි. අඩුම තරමේ 40% කෝටාවට පළාත් පාලනය පිළිබඳ විශේෂඥ දැනුම ඇති අය ගෙන ආ යුතු වෙනවා.

මෙහි දී ඡන්ද දායකයාත් කල්පනා කරන්න ඕනේ අපේ ප්‍රදේශයට ඕනේ දූෂිතයෙක් නොවේ. පළාතට අවශ්‍ය, හැඟීමක් තියෙන කැපවීමෙන් වැඩ කරන අල්ලස දූෂණයෙන් තොර අයකු යන පණිවුඩය ජනතාව දේශපාලන පක්ෂවලට ලබාදිය යුතුයි. ඇතැම් ගම්වල ජනතාව මිට පෙළ ගැසෙමින් සිටිනවා. මාර්තු 12 ව්‍යාපාරයත් රටපුරා මේ කාර්යභාර්ය කරන අතර මෙය දේශපාලන පක්ෂවලට අත්හැර දැමිය නොහැකි තත්ත්වයකට ගෙන ආ යුතුයි. ඊයේ ප්‍රවෘත්තිවල පළවී තිබුණා වයඹ හා මධ්‍යම පළාත් සභා පවත්වන්න බැරි වුණා ඝන පූර්ණය නැති බැවින් කියලා. සභාවටවත් පැමිණෙන්නේ නැති සභිකයෝ ඇයි ජනතාව පත්කර යවන්නේ.

නුවර එළිය වැනි ස්ථාන ගැන කතා කරමින් මැතිවරණය කල් දමන්න එපා. එය පැත්තකින් තබා මැතිවරණය පවත්වන්න. පොළොන්නරුවේ නමත් කඩුව ප්‍රදේශයට වගේ කඩිනමින් විසඳුමක් ද ලබා දිය හැකියි.

**මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා මධ්‍යස්ථානයේ ජාතික සම්බන්ධීකාරක මංජුල ගජනායක මහතා**

මේ මැතිවරණ ක්‍රමය සකස් කරගන්න සියලු දේශපාලන පක්ෂවල දායකත්වය ලබා දී ඇත්නම් මෙය සාර්ථක කරගන්න ද සහයෝගය දෙන්න කියා සියලු දෙනාගෙන් ඉල්ලනවා.

විද්වත් වෘත්තිකයන්ගේ සංගමයේ සභාපති ආනාවුද ජයවර්ධන මහතා

අද වන විට ලැබී ඇති තොරතුරු අනුව කළු ආර්ථිකය 25%-40% වෙනවා. මේ කොටස වැඩි වෙන්න වැඩි වෙන්න ජනතාවට ලැබෙන වරප්‍රසාද අඩු වෙනවා. ඒ නිසා මුදල් තියෙන දූෂිත ජාවාරම්කාරයන් මහජන නියෝජිතයන් ලෙස පත් කරන්න පෙළඹෙන්න එපා කියලා මම ඡන්ද දායකයන්ගෙන් ඉල්ලනවා.

මෙහි දී ශ්‍රී ලංකා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර් නැෂනල්හි ව්‍යාපෘති කළමනාකාර ශම්ද මෙල්, සර්වෝදය ශ්‍රමදාන සංගමයේ නිශාන්ත ප්‍රීතිරාජ්, ශ්‍රී ලංකා පළාත් පාලන ආයතන සංසදයේ විධායක අධ්‍යක්ෂ හේමන්ති ගුණසේකර, පැෆ්රල් සංවිධානයේ විධායක සමන් හමත්ගොඩ යන මහත්ම මහත්මීහු අදහස් දැක්වූහ.




**ඡායාරූපය - සිරිපාල හල්වල**

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම © 2012 සියළුම හිමිකම් ඇවිරිණි.